# යෝජිත ත්‍රස්තවාදය පිටුදැකීමේ පණත් කෙටුම්පත පිළිබඳ ප්‍රාරම්භක ප්‍රකාශය

***2018 සැප්තැම්බර් 18*** - ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත (PTA) සංශෝධනය කර ඒ වෙනුවට ආදේශ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද ත්‍රස්තවාදය පිටුදැකීමේ පණත් කෙටුම්පතේ වැඩි දියුණු කළ පිටපතට කැබිනට් මණ්ඩලය පසු ගිය සතියේ අනුමැතිය ලබා දී ඇති බව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය (CPA) සඳහන් කර සිටී. පණත් කෙටුම්පත සූදානම් කිරීමේ ක්‍රියාවලිය වැඩි විනිවිද භාවයකින් හා සියල්ලන් වඩාත් සම්බන්ධ කර ගනිමින් සිදු කරන්නට ඉඩ තිබූ නමුත් එහි අවසන් ප්‍රතිඵලය වර්තමාන ස්වරූපයෙන් බලාත්මක කෙරුණ හොත් ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත සහ ත්‍රස්තවාදය පිටුදැකීමේ රාමුවේ මීට කලින් එළිදරව් වූ පිටපත යටතේ තහවුරු කරනු ලැබ මේ වන විට පවත්නා ත්‍රස්ත විරෝධී බලතල රාමුවේ සැලකිය යුතු හා බෙහෙවින් සතුටුදායක වැඩි දියුණුවක් සිදු වන බව සඳහන් කළ යුතු ය. ත්‍රස්තවාදයට විරුද්ධව සටන් කිරීම සඳහා රාජ්‍යයට ලබා දෙන විශේෂිත බලතලවලට සම්බන්ධිතව අර්ථාන්විත පිරික්සා බැලීම් හා සමබර කිරීම් (checks and balances) කිහිපයක් තහවුරු කරන හෙයින් පණත් කෙටුම්පතෙන් යෝජනා කෙරෙන නව රාමුවෙන් පුද්ගලයාගේ නිදහස සහ රාජ්‍යයේ බලතල අතර වැඩි සමබරතාවක් ඇති වනු ඇත.

ජාතික හා ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතීන්ට වඩාත් අනුරූප කිරීම සඳහා පණත් කෙටුම්පතේ වැඩි දියුණු කිරීම් කළ හැකි බව සඳහන් කරන විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ත්‍රස්තවාදය වැළැක්වීමේ පණතේ අඩංගු වූ වඩාත් බරපතළ පැතිකඩවල් බොහොමයක් ඉවත් කර හෝ යටත් පිරිසෙයින් වැඩි දියුණු කර ඇති බව විශේෂයෙන් සඳහන් කර සිටී. පාපෝච්චාරණ පිළිගැනීමේ හැකියාව (ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත යටතේ මෙය ස්ථානීය වධහිංසා සහ අත්තනෝමතික ලෙස වරදකරුවන් කිරීම සඳහා ඉඩ සලසා දුන්නේ ය) සහ අදහස් පළ කිරීමේ නිදහසට භයංකර බලපෑමක් කරන පමණට වඩා පුළුල් විධිවිධාන ඉවත් කිරීම ද මේ අතරට ඇතුළත් වේ. සැකකරුවන්ට නීති උපදේශකයන් හා මහේස්ත්‍රාත්වරුන් වෙත ප්‍රවේශ වීමේ හැකියාව ලබා දීම, මානව හිමිකම් කොමිසමේ කාර්ය භාරය වඩාත් පුළුල් කිරීම සහ අත් අඩංගුවට ගැනීමේ හා රඳවා ගැනීමේ බලතල වඩාත් ප්‍රබල අධිකරණමය සුරැකියාවන් හරහා පරීක්ෂාවට ලක් කිරීම හා චෝදනා ඉදිරිපත් කිරීමකින් තොරව රඳවා තබා ගැනීමට අවසර ලැබෙන කාල සීමාවන් අඩු කිරීම වැඩි දියුණු කිරීම් අතරට ඇතුළත් වේ.

එහෙත් ආණ්ඩුවේ සමහර සාමාජිකයන් පණත් කෙටුම්පතේ ඇතුළත් වඩාත් ලිබරල් විධිවිධාන පිළිබඳව සැකසංකා පළ කර ඇතැයි මාධ්‍ය වාර්තා පළ වී තිබීම සහ කමිටු මට්ටමේ දී කරනු ලබන සංශෝධනයන් මගින් ප්‍රතිගාමී ලක්ෂණ නැවතත් හඳුන්වා දීමේ තර්ජනයක් පැවතීම ගැන විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කනස්සල්ලට පත්ව සිටී. කමිටු මට්ටමේ දී සිදු වන එවැනි සංශෝධනයන් ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතියේ හා පුරවැසියන්ගේ සුපරීක්ෂාවෙන් තොරව සිදු වීම ගැන ද විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය එක දිගට ම සිය කනස්සල්ල පළ කර ඇත. මෙම ඉල්ලීම් ප්‍රතික්ෂේප කරන ලෙසත් ඒකාධිපතිවාදයේ අරමුණුවලට සේවය කරන හා අනාගත මානව හිමිකම් උල්ලංඝනයන්ට මග පාදන මූලධර්ම විරහිත සංශෝධනයන් හරහා පණත් කෙටුම්පතේ සාකල්‍යතාව විකෘත හා විනාශ නොකෙරෙන බව සහතික කරන ලෙසත් අපි ආණ්ඩුවෙන් ඉල්ලා සිටිමු. පාර්ලිමේන්තු අදියරට පෙර එහි අන්තර්ගතය පිළිබඳ වඩාත් පූර්ණ මහජන සුපරීක්ෂාවකට හා විවාදයකට හැකියාව ලබා දීම සඳහා හැකි මුල් ම අවස්ථාවේ දී ම පණත් කෙටුම්පත ප්‍රසිද්ධ කරන ලෙස ද විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ආණ්ඩුවෙන් ඉල්ලා සිටී.

Centre for Policy Alternatives (Guarantee) Limited | 6/5, Layards Road, Colombo 5, Sri Lanka
Tel: ++94112081384, +94112081385, +94112081386 | Fax: +9411 2081388 | Email: info@cpalanka.org | Web: www.cpalanka.org